## 2024-03-25 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. CODEGEN INNOVATIONS (PRIVATE) LIMITED ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම**

මෘදුකාංග, දත්ත විද්‍යාව, නිර්මාණකරණය සහ දෘඩාංග යන අංශවලින් තාක්ෂණික විසඳුම් ලබා දීමේ විශේෂඥතාවක් දක්වන CodeGen සමූහයේ අංශයක් වශයෙන් CODEGEN INNOVATIONS (PRIVATE) LIMITED ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි. එම සමාගම කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් බලයලත් තැනැත්තෙකු වශයෙන් අනුමත කර ඇති අතර, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම සඳහා එකී සමාගම විසින් ඉල්ලුම් කර ඇත. එම සමාගම ඇමෙරිකානු ඩොලර් 500,000ක මූලික ආයෝජනයක් සිදු කරමින් වසර 05ක් වන විට ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 15ක් උපයා ගැනීමටත්, එම කාලය ඇතුළත ආසන්න වශයෙන් රැකියා අවස්ථා 400ක් නිර්මාණය කිරීමටත් සැලසුම් කර තිබේ. එබැවින්, 2023 අංක 02 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල විධිවිධාන පරිදි එම සමාගම නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සපුරා තිබේ. ඒ අනුව, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන යටතේ CODEGEN INNOVATIONS (PRIVATE) LIMITED වෙත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමටත්, ඒ සඳහා වන නියමයක් ගැසට් පත්‍රයේ පළ කිරීමටත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. ශ්‍රී ලාංකීය ධජය යටතේ නෞකා ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම**

නෞකා ලියාපදිංචිය දේශීය ආර්ථිකයට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ගලා එන ප්‍රධාන මාර්ගයක් වන අතර, ඒ ආශ්‍රිතව සෘජු හා වක්‍ර රැකියා අවස්ථා රාශියක් බිහි කිරීමට විභවයක් පවතී. ශ්‍රී ලාංකීය ධජය යටතේ නෞකා ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසුකම් සහිත දේශීය හා විදේශීය ආයතන වෙතින් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවා යෝජනා ලබා ගැනීමටත්, තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් එකී යෝජනා ඇගයීමට ලක් කර ප්‍රසම්පාදන කමිටුවක නිර්දේශ මත වඩාත් යෝග්‍යතම ආයතන තෝරා ගැනීමටත් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன வீதி, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

03. **කොරියානු ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ පුහුණු පාඨමාලා සහ අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම**

ඕරුගොඩවත්ත ශ්‍රී ලංකා - කොරියානු ජාතික වෘත්තීය පුහුණු ආයතනය කොරියානු අපනයන ආනයන බැංකුව විසින් සපයන ලද රුපියල් මිලියන 2,900ක මූල්‍ය ආධාරයක් යටතේ ඉදිකරනු ලැබ ඇති අතර, එම ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා සහ ආයතනයේ දැනට පවතින පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීම පිණිස ඇමෙරිකානු ඩොලර් මිලියන 1.5ක මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට කොරියානු අපනයන ආනයන බැංකුව විසින් එකහතාව පළ කර තිබේ. මාස 16ක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය යටතේ, මෝටර් රථ තාක්ෂණය, නිෂ්පාදන තාක්ෂණය - CNC, පෑස්සුම් තාක්ෂණය, විදුලි තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික තාක්ෂණය, ස්වංක්‍රියකරණය සහ රොබෝ තාක්ෂණය, තරල බල තාක්ෂණය, මෙකාට්‍රොනික් තාක්ෂණය ඇතුළු සියලුම පාඨමාලාවන්වල පොදු අවශ්‍යතාවන් සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂිතය. යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස දෙපාර්ශ්වය අතර අත්සන් තැබීමට නියමිත කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකහතාව ලැබී තිබේ. ඒ අනුව, අදාළ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ දැනට ක්‍රියාත්මක වන අධිවේගී මාර්ග සහස්‍යා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් වෙත පැවරීම**

අධිවේගී මාර්ග ජාලය, අධිවේගී මාර්ග සතු ඉඩම්, අධිවේගී මාර්ග ණය (දේශීය) සහ අදාළ කාර්යමණ්ඩලය වඩාත් වාණිජමය වශයෙන් කළමනාකරණ කිරීමට හැකි වන පරිදි මාර්ග සංවර්ධන අධිකාරියෙන් වෙන් කොට සහස්‍යා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් වෙත පැවරීම පිණිස 2023-06-26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සහ ඒ සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සඳහා 2024-02-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අධිවේගී මාර්ගවල දෛනික මෙහෙයුම් කටයුතු හා කළමනාකරණ කටයුතු 2024-04-01 දින සිට විධිමත් කළමනාකරණ ගිවිසුමක් යටතේ සහස්‍යා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් වෙත පැවරීමටත්, මාර්ග සංවර්ධන අධිකාරිය සහ සහස්‍යා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් ඒකාබද්ධව සිදු කරන නීතිමය හා මූල්‍යමය ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව අදාළ සියලු වත්කම් මාස 06ක කාලයක් ඇතුළත සහස්‍යා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් වෙත පැවරීමටත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව විසින් වාර්ෂිකව පවත්වන අන්තර්ජාතික සමුළුව 2024 වසරේදී ශ්‍රී ලංකාවේදී පැවැත්වීම**

ලෝකයේ ගම්මිරිස් නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන රටවල් එක්ව 1972 වර්ෂයේදී ආසියා සහ පැසිෆික් කලාපයන්හි එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම යටතේ ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව නමැති අන්තර්ජාතික සංවිධානය පිහිටුවාගෙන ඇත. මෙම සංවිධානයේ ප්‍රධාන සහ ස්ථිර සාමාජික රටවල් ලෙස ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව සහ වියට්නාමය කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාව 2002 වර්ෂයේදී ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාවේ ස්ථිර සාමාජිකත්වය ලබා ගෙන ඇති අතර, 1999, 2006, 2012 සහ 2017 යන වසරවලදී එහි වාර්ෂිකව පවත්වන අන්තර්ජාතික සමුළුව මෙරටදී පවත්වා ඇත. ඒ අනුව, ගම්මිරිස් නිෂ්පාදනය හා සම්බන්ධ තාක්ෂණික හා ආර්ථික පර්යේෂණ ප්‍රතිඵල සාමාජික රටවල් අතර හුවමාරු කර ගැනීම, සාම්ප්‍රදායික හා නව වෙළෙඳපොළ සඳහා වැඩසටහන් සකස් කිරීම හා ප්‍රවර්ධනය කිරීම, අන්තර්ජාතික වෙළෙඳාම තුළ තීරුබදු හා තීරුබදු නොවන බාධක ලිහිල් කිරීම සඳහා සහයෝගිතාව ඇති කර ගැනීම යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඒකඟතාවන්ට පැමිණීමේ අරමුණින් ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාවේ 52වන අන්තර්ජාතික සමුළුව මෙම වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **මෙගාවොට් 1 සිට 5 දක්වා AC ධාරිතාවකින් යුත් මෙගාවොට් 70ක ධාරිතාවක් ස්ථාපනය කිරීම සඳහා සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා විදුලි බලාගාර ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය**

ග්‍රිඩ් උපපොළවල් 11ක මෙගාවොට් 1 සිට 5 දක්වා AC ධාරිතාවකින් යුත් මෙගාවොට් 70ක ධාරිතාවක් ස්ථාපනය කිරීම සඳහා සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා විදුලි බලාගාර ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ වසර 20ක මෙහෙයුම් කාලසීමාවක් සහිතව ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීම යන පදනම මත ස්ථාපනය කිරීම සඳහා ග්‍රිඩ් උපපොළවල් 05ක මෙගාවොට් 51ක් සැපයීමට අදාළ කොන්ත්‍රාත්තු පිරිනැමීම පිණිස 2023-10-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඉතිරි ග්‍රිඩ් උපපොළවල් 06ක් සඳහා මෙගාවොට් 19ක් සැපයීම පිණිස නැවත යෝජනා කැඳවා තිබේ. ඒ අනුව, ඉදිරිපත් වී ඇති යෝජනා සැලකිල්ලට ගෙන, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබ ඇති සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශ පරිදි අම්පාර, හබරණ, කොස්ගම,

කුරුණෑගල, පන්නල හා වේයන්ගොඩ යන ග්‍රිඩ් උපපොළවල් සඳහා සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා විදුලි බලාගාර ස්ථාපිත කිරීම පිණිස වන කොන්ත්‍රාත්තු අදාළ ආයෝජකයන් වෙත පිරිනැමීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ විධිවිධාන පරිදි පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ආඥාවක් ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ තීරු බදු ලිහිල්කරණ වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීම පිණිස 2023-05-29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, 2023-07-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුමේ තීරු බදු ලිහිල්කරණ වැඩසටහනෙහි 6 වන කාණ්ඩයට අදාළව, වර්ගීකරණය කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1,116ක් මත පනවා ඇති සේගු ආනයන බද්දෙහි පළමු වාර්ෂික අදියර ඉවත් කිරීම ක්‍රියාත්මක කිරීම පිණිස 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ විධිවිධාන පරිදි ආඥාවක් 2023-06-30 දින රජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එම ආඥාව සඳහා 2023-10-04 දින පාර්ලිමේන්තු අනුමැතිය ද ලැබී තිබේ. එකී තීරු බදු ලිහිල්කරණ වැඩසටහනෙහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීම පිණිස එම වැඩසටහනේ 6 වන කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1,222ක් සඳහා අදාළ වන සේගු ආනයන බද්ද ඉවත් කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ විධිවිධාන පරිදි ආඥාවක් 2024-01-04 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී ආඥාව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත අත්හිටුවීම**

සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS Code) 210ක් යටතේ වර්ගීකරණය වන භාණ්ඩ වර්ග 64ක් ආනයනය කිරීමේදී පහසුකම් සැලසීම සඳහා තනි සංයුක්ත බද්දක් අය කිරීම පිණිස 2007 අංක 48 දරන

විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පනවනු ලැබ ඇත. එම බද්ද ක්‍රියාත්මක කිරීමේදී පැන නැගී ඇති විවිධ ගැටලු හේතුවෙන් එකී බදු පනත අත්හිටුවීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, එකී පනත අත්හිටුවීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත ප්‍රතිස්ථාපනය කිරීම

වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2023-06-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එහෙත්, එම සංශෝධන මගින් පනතේ වගන්ති වැඩි සංඛ්‍යාවක් සංශෝධනය කිරීමට සිදු වන බැවින්, පොදු මහජනතාවගේ පහසු අවබෝධය සඳහා දැනට බලාත්මක පනත පරිච්ඡින්න කර, අදාළ සියලු සංශෝධන ඇතුළත් කරමින් එම පනතේ වත්මන් නාමය යටතේම නව පනතක් පැනවීම යෝග්‍ය බව පෙනී ගොස් තිබේ. ඒ අනුව, කටයුතු කිරීමට හැකි වන පරිදි නව පනතක් කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම

2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතේ විධිවිධාන පරිදි ජාතික අවම වැටුප රුපියල් 12,500/-ක් ලෙස නියම කරනු ලැබ ඇත. ජාතික කම්කරු උපදේශක සභාවේ නිර්දේශ මත පත් කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයකින් නියෝජනය කරන වෘත්තීය සමිති සහ සේවායෝජකයන් ඇතුළත් ත්‍රෛපාර්ශ්වික අනුකමිටුවක් මගින් එම වැටුප රුපියල් 17,500/-ක් දක්වා වැඩි කිරීමට නිර්දේශ කරනු ලැබ තිබේ. ඒ අනුව, ජාතික අවම වැටුප රුපියල් 12,500/- සිට රුපියල් 17,500/- දක්වා රුපියල් 5,000/-කින් වැඩි කිරීමට සහ ජාතික අවම

දෛනික වැටුප රුපියල් 500/- සිට 700/- දක්වා රුපියල් 200/-කින් වැඩි කිරීමට හැකි වන පරිදි 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන පනත සංශෝධනය කිරීම සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 11. ශ්‍රී ලංකාව සඳහා ජාතික ඩිජිටල් ආර්ථික උපායමාර්ගය

2048 වන විට ඉහළ ආදායම් ලබන ආර්ථිකයක් බවට පත් කිරීමේ රටේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සහ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා ජාතික ඩිජිටල් ආර්ථික උපායමාර්ග සහ එහි ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගේ සහභාගිත්වයෙන් සහ වෘත්තීය ආයතන හා වෘත්තීය මණ්ඩලයන්ගේ උපදේශකත්වයෙන් "ශ්‍රී ලංකාව සඳහා ජාතික ඩිජිටල් ආර්ථික උපායමාර්ගය - 2030" පිළියෙල කරනු ලැබ ඇත. එකී උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම පිණිස තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 12. ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස 2024-03-04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු අන්තර්ගත කරමින්, එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජයට සහාය වීම පිණිස ආර්ථික කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ආයෝජන කලාප, ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලය, ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා හා ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය සහ ජාතික ඵලදායිතා කොමිෂන් සභාව යන ප්‍රධාන ආයතන ස්ථාපිත කිරීමට හැකි වන පරිදි අවශ්‍ය විධිවිධාන ඇතුළත් කරමින් ආර්ථික පරිවර්තන පනත සඳහා වන මූලික කෙටුම්පත පිළියෙල කරනු ලැබ ඇත. ඒ අනුව, නීතිපති විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධනයන් ද ඇතුළත් කරමින් විධිමත් පනත් කෙටුම්පත කඩිනමින් සකස් කර ඉදිරිපත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************